


# කට කතාවලට බය නැති සාහිෆ්

සාහිෆ් මේ වනවිට හින්දි පුරයේ නමක් දිනාගෙන සිටින නළුවෙකි.
එහෙත් තරමක් ආඩම්බර ගති ඇති සාහිෆ් ලැබෙන දුරකතන ඇමතුම්වලට කතා කරන්නේ කලාතුරකිනි. ඔහුට අනුන් ගැන, ලැබෙන දුරකතන ඇමතුම් ගැන සැලකිල්ලක් නැත.
ඉතින් තරුණ මාධ්‍යවේදීන්ට ලබාදෙන වේලාවල් පවා වෙනස් කිරීමට ඔහු සමතෙකි. ඇතැම් වෙලාවක ඔහුම මාධ්‍යවේදීන්ට පවා පවසන්නේ සාහිෆ් කලින් නින්දට ගොස් ඇති බව කියමිනි.
ඔහුට දිනකට ලැබෙන කෙටි පණිවිඩ එකසිය පනහ කි. දුරකතන ඇමතුම් ප්‍රමාණය ගණන් කළ නොහැකි තරම්ය.
අවුරුදු කිහිපයකට පසු ඔහු හම් තුම් :ඎප ඔපප* චිත්‍රපටයේ ප්‍රධාන චරිතයකට පණ පෙවීය. හම් තුම් කාලයට ගැළපෙන චරිතයක් ලෙස පෙන්වා දෙන සාහිෆ් මෙය පවුලේ සැමට එකට වාඩි වී නැරඹිය හැකි චිත්‍රපටියක් ලෙසද පෙන්වා දෙයි.
හම් තුම් අපි බලාපොරොත්තු වූ අයුරින්ම සාර්ථක වුණා. ඒක චිත්‍රපටියේ වැඩ කළ අපි කාගේත් සතුටට කරුණක්.
හම් තුම් රූගත කිරීම් වලදී රාණි මුකර්ජි සහ ඔබ අතර ප්‍රශ්ණ ඇති වුණා කියන කතාව ඇත්තක්ද?
මාධ්‍යවේදියාගෙන් බලාපොරොත්තු විරහිත පැනයකි.
රාණි සමහර සිප ගැනීමේ දර්ශන ප්‍රතික්ෂේප කළා කියන කතාව ඇත්තක්. ඒත් ඒ මම නිසා නෙමෙයි. ඒ එම දර්ශනවල තිබුණු සිපගැනීමේ ක්‍රමයේ ඇති වරදක් නිසා. ඇත්තටම ඒ අවස්ථාවේ මම හිටියේත් රාණිගේ පැත්තේ. මම අධ්‍යක්‍ෂකට පවා ඒ ගැන විස්තර කරලා දුන්නා. මම මේ ක්ෂේත්‍රයට ඇවිත් අවුරුදු දොළහකට වැඩියි. පුරුදු වෙන්න රඟපානවා නෙමෙයිනේ. මම දන්නවා එවැනි සරාගී දර්ශන වුණත් ප්‍රශ්න මතු නොවෙන්නට කරන්න. අවසා-නයේදී එවැනි සිප ගැනීමේ දර්ශන පවා ප්‍රශ්න මතු නොවෙන්නට කළා.
දවසක් ප්‍රීති කිව්වා ඇය වඩාත් කැමති ෂාරුක්ට කියලා. ෂාරුක් එක්ක රඟපාන්න ඇය වඩාත් ඇලුම් කළේ ඔහුගේ කොමඩි දර්ශන නිසා.
ඇත්තටම ෂාරුක් එක්ක රඟපාන මුල්ම වකවා-නුවේ මගේ හිතෙත් චකිතයක් තිබුණා මිනිස්සු මගේ චරිතය කොහොම වැළඳ ගනීවිද කියලා.
මොකද ෂාරුක් කියන්නේ ඉන්දියානු ප්‍රේක්‍ෂකයන්ගේ සිහින කුමාරයා නිසා. මොකද චිත්‍රපටයක චරිතයකදී වුණත් ඔහුට අසාධාරණයක් වෙනවට ප්‍රේක්‍ෂකයන් කැමති නැති නිසා.
කල් හෝ නා හෝ (Khal Ho Naa Ho) චිත්‍රපටියෙන් පසු ඔබත් ප්‍රීති සින්ටාත් නම් පටලා ඇති වූ කට කතා ගැන මොනවද කියන්නේ.
මේ සියල්ල අමූලික බොරු. ප්‍රීති කියන්නේ මගේ හොඳ යෙහෙළියක් වුණත් ඇය හමුවෙන්න මට වේලාවක් නැහැ. අනික මම දුරකතනයටත් කැමති පුද්ගලයෙක් නෙමෙයිනේ. අපි හොඳ මිතුරන්. ඇය මම ගොඩක් විශ්වාස කරනවා. ෂුටිං වලදී අපි ගොඩක් රෑ වෙනකං කතා කර කර හිටිය එක ඇත්ත. සමහර දවස්වල පැය ගණන් අවධියෙන් හිටියා.
අපේ අවට විවිධ අදහස් තියෙන අය හිටියානේ. ඔවුන් අපට කතා හදලා. ඕනෙ දෙයක් කියපුදෙන්. අපි දෙන්නම ඕවා ගණන් ගන්න අය නෙමෙයි.
ඇත්තටම මේ කට කතාවලට ඔබේ බිරිඳ අම්රිතාගෙන් ලැබුණේ මොන වගේ ප්‍රතිචාරයක්ද?
මමත් අම්රිතාත් මේ පිළිබඳව පෞද්ගලිකව කතා කරලා නැහැ. මේවාට මුහුණ දෙන්නේ කොහොමද කියලා.
කටකතා වුණත් බිරිඳක් හැටියට එයා තිගැස්සෙන්න ඇති. මේ හැමදේටම මුල මාධ්‍ය කියලා කියන්න මම බය නැහැ. නමුත් ඇත්ත කියන්නේ ඇත්ත. කවදා හරි ඇත්ත හෙළිවේවි. මගේ පවුල් ජීවිතය මට ඉතාම වැදගත්. අම්රිතා ඒ ගැන හොඳින්ම දන්න නිසා ඇය මේවා විශ්වාස කරන එකක් නැහැ. තවත් කටකතාවක් හැදෙන තුරු මේ කටකතාව පැතිරේවි.




**භාෂිණී සමරසිංහ**



